# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2159/36 - 2020 ජනවාරි මස 23 වැනි බ්‍රහස්පතින්දා - 2020.01.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**02 වන සංශෝධනය**

ශ්‍රී ලංකා මිනින්දෝරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය

2019 ඔක්තෝබර් 04 දිනැති, අංක 2143/52 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රය මඟින් සංශෝධිත 2018.12.24 දිනැති අංක 2103/2 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රය මඟින් පළකරන ලද ශ්‍රී ලංකා මිනින්දෝරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය 2018.12.24 දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත දැක්වෙන ආකාරයට සංශෝධනය කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

එම්.ඒ.බී. දයා සෙනරත්,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2019 දෙසැම්බර් මස 24 දින,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 1200/9, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**සංශෝධිත ඡේද :**

10.3.1 VI. ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී තනතුර දරන නිලධාරියකු වීම.

11.2

| තනතුර | සුදුසුකම් |
|---|---|
| (අ) සර්වේයර් ජනරාල් | අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරනු ලැබේ. |
| (ආ) අතිරේක සර්වේයර් ජනරාල් | සර්වේයර් ජනරාල් හැර ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ විශේෂ ශ්‍රේණියේ ඊලඟ ජ්‍යෙෂ්ඨතම නිලධාරීන් පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව අතිරේක සර්වේයර් ජනරාල් තනතුරුවලට පත් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදුකරනු ලැබේ. |



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| තනතුර | සුදුසුකම් |
|---|---|
| (ඈ) ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් | සර්වේයර් ජනරාල් සහ අතිරේක සර්වේයර් ජනරාල්වරුන් හැර ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ විශේෂ ශ්‍රේණියේ ඊළඟ ජ්‍යෙෂ්ඨතම නිලධාරීන් පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් තනතුරුවලට පත් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදුකරනු ලැබේ. |
| (ඇ) නියෝජ්‍ය සර්වේයර් ජනරාල්/පළාත් සර්වේයර් ජනරාල් | ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරීන් අතරින් තනතුරට පත් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබේ. |
| (ඉ) ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි | මිනින්දෝරු අධිකාරී තනතුරු දරන ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරීන් අතරින් ජ්‍යෙෂ්ඨතම නිලධාරීන් පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි තනතුරුවලට පත් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදුකරනු ලැබේ. (තනතුරට පත් කිරීමේදී වැඩ බැලීම් / රාජකාරි ඉටු කිරීම් පත්වීම් ලබා දී ඇති නිලධාරීන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.) |
| (ඊ) මිනින්දෝරු අධිකාරි | ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිවරුන් හැර ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ I වන ශ්‍රේණියේ හෝ II වන ශ්‍රේණියේ ඊළඟ ජ්‍යෙෂ්ඨතම නිලධාරීන් පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව මිනින්දෝරු අධිකාරි තනතුරුවලට පත් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදුකරනු ලැබේ. |

02 - 89

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.